අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/02/29/25/03/01-ඉංග්‍රීසි

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2024.05.

සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සුදුසුකම්ලාභීන් සියලුදෙනා වෙත,

<u>**දිවයිනේ ජාතික හා පළාත් පාසල්වල පවතින ඉංග්‍රීසි විෂය ගුරු පුරප්පාඩු සඳහා ඩිප්ලෝමාධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ -3-I(ඇ) ශ්‍රේණියට බඳවා ගැනීම(2024)**</u>

ඉහත බඳවා ගැනීම සම්බන්ධයෙන් ප්‍රසිද්ධ කරන ලද 2021.03.15 දිනැති පුවත්පත් නිවේදනය අනුව 2021.12.12 දින පවත්වන ලද විභාගයේ ප්‍රතිඵල අනුව ඉංග්‍රීසි විෂය සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ I (ඇ) ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා ඔබේ සුදුසුකම් පරීක්ෂා කර බැලීමේ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය හා ප්‍රායෝගික පරීක්ෂණය 2024.05.10, 11, 13 හා 20 යන දිනයන්හි දී බත්තරමුල්ල,ඉසුරුපාය, අධ්‍යාපන අමාත්‍යාංශයේදී පැවැත්වේ.

02. මේ සඳහා සුදුසුකම් ලබන අයදුම්කරුවන්ගේ නාම ලේඛන ඇමුණුම 01 හි ඇතුලත් වේ.

01<u>**. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය**</u>

**1.1** එම ඇමුණුම් 01 හි ඇතුලත් සුදුසුකම් ලැබූවන් පහත සඳහන් සහතික/ ලේඛනවල මුල් පිටපත් හා ඡායා පිටපත් (<u>**තමා විසින් සහතික කරන ලද**</u> ) වෙන් වෙන්ව අමුණන ලද ගොනු දෙකක් ද රැගෙන එහි සඳහන් නියමිත වේලාවට සහභාගී වන ලෙස කාරුණිකව දන්වමි.

I. ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රය

II. උප්පැන්න සහතිකය ( කෙටි උධෘත භාරගනු නොලැබේ.විවාහයෙන් පසු නම වෙනස් කර ඇත්නම් විවාහ සහතිකයද සමඟ දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු වේ.)

**III.** <u>**විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද අ.පො.ස.සාමාන්‍ය පෙළ විභාග සහතිකය**</u>
(විභාග කොමසාරිස් ජනරාල් විසින් දේශීය හා විදේශීය අ.පො.ස.සාමාන්‍ය පෙළ විභාගය හා සමානව පිළිගනු ලබන විභාග සමතුන් විසින් ඒ බව සහතික කරන ලද විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද සහතිකය රැගෙන පැමිණීම අනිවාර්ය වේ. )

IV. ඔබ විසින් විභාගය සඳහා ඉල්ලුම් කරන ලද අයදුම්පත්‍රයේ සඳහන් කරන ලද ඩිප්ලෝමා සහතිකය. (එම සහතිකය ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) විසින් පිරිනමනු ලබන ඩිප්ලෝමා සහතිකය නොවේනම් එම ඩිප්ලෝමාවට අදාළ NVQ මට්ටම් සනාථ කරන ලේඛන ඉදිරිපත් කළ යුතුය.)

V. පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරී සහතිකය

VI. මෑතකදී ලබා ගත් චරිත සහතික 01 (ග්‍රාම නිලධාරී සහතිකය හැර)

VII. ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන සහතිකවල නමේ වෙනසක් පවතීනම් ඊට අදාළ දිවුරුම් ප්‍රකාශ

ඉහත දක්වා ඇති සියලුම ලේඛන <u>**සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ දිනයේදී ම ඉදිරිපත් කළ යුතු අතර පසුව ඉදිරිපත් කරනු ලබන ලේඛන භාර ගනු නොලැබේ.**</u>

සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම ලබන අයදුම්කරුවන්, එදිනම පැවැත්වෙන ප්‍රායෝගික පරීක්ෂණයට ද සහභාගී විය යුතු වේ.

02. <u>ප්‍රායෝගික පරීක්ෂණය</u>

2.1 1885/38 හා 2014.10.23 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ 7.2.3.4 වගන්තිය අනුව ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I (ඇ) ශ්‍රේණියට ගුරුවරුන් බඳවා ගැනීම සඳහා වන ප්‍රායෝගික පරීක්ෂණය සඳහා පහත පරිදි සූදානම්ව සහභාගී වන ලෙස කාරුණිකව දන්වමි.

2.2 මෙම පරීක්ෂණය ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ " ආ" පරිශිෂ්ටයට අනුව පහත සඳහන් පරිදි සිදු කෙරේ.

2.3 ප්‍රායෝගික පරීක්ෂණය වශයෙන් අයදුම්කරු විසින් ඉල්ලුම්කරන ලද විෂයෙහි පාසල් විෂය නිර්දේශයට අදාළව හඳුනා ගන්නා ලද මාතෘකාවක් යටතේ ඉදිරිපත් කිරීමක් කළ යුතුය. මේ සඳහා පහත පරිදි ලකුණු හිමි වේ.

| අනු අංකය | ප්‍රායෝගික පරීක්ෂණයේදී ලකුණු ලබා දෙනු ලබන නිර්ණායක | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | අරමුණ හා ප්‍රවිශ්ට වීම | 05 | 02 |
| 02. | පෞරුෂය හා හඬ පාලනය | 05 | 02 |
| 03. | සන්නිවේදනයේ පැහැදිලි බව | 05 | 02 |
| 04. | කාල කළමනාකරණය | 05 | 02 |
| 05. | ඉදිරිපත් කිරීමේ ශිල්පක්‍රම භාවිතය | 05 | 02 |
| මුළු ලකුණු ප්‍රමාණය | | 25 | 10 |

2.4 ප්‍රායෝගික පරීක්ෂණ ක්‍රමවේදය

I. ප්‍රායෝගික පරීක්ෂණය සඳහා විනාඩි පහ( 5) ක කාලයක් ලබා දෙනු ලැබේ.
II. ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය විසි පහ (25) කි.
III. ප්‍රායෝගික පරීක්ෂණය සමත්වීම සඳහා එක් එක් නිර්ණායක සඳහා අවම වශයෙන් ලකුණු 2 බැගින් ලබා ගත යුතුය.
IV. ප්‍රායෝගික පරීක්ෂණයේ ඇගයීම අධ්‍යාපන විෂය භාර රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබේ.

2.5 නිර්ණායකයන්හි අරමුණ

I. අරමුණ හා ප්‍රවිශ්ට වීම
සාර්ථකව පාඩමෙහි අරමුණ පැහැදිලි කිරීම හා පාඩමට ප්‍රවිශ්ට වීමේ හැකියාව ඇගයීම
II. පෞරුෂය හා හඬ පාලනය
ගුරුවරයෙකු ලෙස මනා පෞරුෂයකින් යුතු වීම හා ඉගැන්වීමේදී මනා ලෙස හඬ පාලනය කිරීමේ ඇති හැකියාව ඇගයීම
III. සන්නිවේදනයේ පැහැදිලි බව
ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී අදාළ කරුණු ඵලදායි ලෙස සන්නිවේදනය කිරීමේ හැකියාව ඇගයීම
IV. කාල කළමනාකරණය
ලබා දෙනු ලබන කාල සීමාව තුළ අරමුණ කෙරෙහි ළඟා වීමේ කුසලතාවය ඇගයීම
V. ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතය
අරමුණ කෙරෙහි ළඟා වීම සඳහා ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම මනා ලෙස භාවිතා කිරීමේ හැකියාව ඇගයීම

03. ඉහත සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය හා ප්‍රායෝගික පරීක්ෂණය සඳහා නියමිත දිනයේදී සහභාගී නොවන අයදුම්කරුවන් පිළිබඳ පසුව කිසිදු අයුරකින් සලකා බලනු නොලැබේ.

04. මෙම පරීක්ෂණ සඳහා සහභාගී වීමම පත්වීමක් ලැබීමට සුදුසුකමක් නොවන බව ද සැලකිය යුතුය.

05. මෙම පරීක්ෂණ වලට සහභාගී වීම සඳහා ගමන් වියදම් හෝ උපවේශන දීමනා කිසිවක් ගෙවනු නොලැබේ.

ඒ.ජේ.එස්.එස්.එදිරිසූරිය
අතිරේක ලේකම්(ගුරු ආයතන)

අත්/කළේ : ජේ.එම්.තිලකා ජයසුන්දර
අධ්‍යාපන ලේකම්